**ශීර්ෂය 436 - වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට වාහන නියාමනය, බස් රථ ප්‍රවාහන සේවා හා දුම්රිය මැදිරි හා මෝටර් රථ කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛණ සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදකවූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් බව ඇගයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) පසුගිය වර්ෂයේ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබූ නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂය අංක 436-1-2-0-1404-11 යටතේ ඇස්තමේන්තු ප්‍රතිපාදන රු.32,000,000 ක් වී තිබූ අතර මු.රෙ.66 මඟින් රු.15,530,000 ක් වූ ප්‍රතිපාදන ඉවත්කල පසුද රු.3,738,109 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. | ප්‍රවාහන අමාත්‍යාංශය පවත්වාගෙන ගිය ගොඩනැගිල්ල තුළ රාජ්‍ය අමාත්‍යාංශයද පිහිටුවන ලදී. එබැවින් එම ස්ථානයට කුළී ගෙවීමක් සිදු කිරීමට නොමැති වූ බැවින් වරිපනම් බදු පමණක් ගෙවා මෙම ගොඩනැගිල්ල පරිහරණය කරන ලදී. එබැවින් මෙම වැය විෂය යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදන ඉතිරි විය. | අවශ්‍යතා නිසිපරිදි හඳුනා ගෙන අයවැය ඇස්තමේන්තු සකස් කලයුතු වීම සහ ලබාගත් ප්‍රතිපාදන නිශ්චිත කාර්ය සඳහා යෙදවීමට වග බලාගත යුතුවීම. |
| (ආ) | වැය විෂයයන් 2 ක් සඳහා රු.395,000,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා තිබුණද කිසිදු වියදමක් නොදරා මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි. | 436-1-1-0-1102 }<br>436-1-2-0-1102 }<br>විදේශ ගමන්සීමා කර තිබීම නිසා වෙන් කළ ප්‍රතිපාදන වියදම් නොවීම. | අවශ්‍යතා නිසිපරිදි හඳුනා ගෙන අයවැය ඇස්තමේන්තු සකස් කලයුතු වීම. |
| (ඇ) | වැය විෂයයන් 15 ක් සඳහා රු.2,103,560,000 ක ඇස්තමේන්තු ප්‍රතිපාදන සලසා තිබුණද ඉන් රු.450,512,388 ක් ඉතිරිවීම් නිරීක්ෂණය විය. එය ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 13 සිට 97 ක පරාසයක විය. | ඉන්දියානු ණය අධාර යටතේ ශ්‍රී ලංගම වෙත බස්රථ ආනයන සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු අවසන් වී නොතිබීම නිසා කිසිදු වියදමක් නොදරන ලදී. | අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘති නියමිත කාලය තුලදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කලයුතු වීම. |

**2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

-----------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථාවක් පහත විග්‍රහ කර දැක්වේ.

| **නිරීක්ෂණය** | | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| ------------------------- | ------------- | --------------------- | ------------- |
| **<u>ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහ</u>** | | | |
| **මුදල් රෙගුලාසි අංක 880** | ඇප තැන්පත් කළ යුතු මුදල් හා ගබඩාව භාර නිලධාරියන් විසින් ඇප තැන්පතු තබා නොතිබුණි. | අමාත්‍යාංශය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් නොවන අතර 2022 වර්ෂයේ සිට ස්ථිර කාර්ය මණ්ඩලයක් වශයෙන් සංවර්ධන නිලධාරින් පත් කර ඇත. මෙම නිලධාරීන්ගෙන් ඇප මුදල් අය කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කලයුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

----------------------------

**3.1 අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘතින්හි කාර්යසාධනය**

--------------------------------------------------------------------------------

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ---------------------- | -------------------------------- | ------------ |
| (අ) ඉන්දියානු ණය අධාර යටතේ ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා බස්රථ ආනයනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 3692 ක ඇස්තමේන්තුවකට යටත්ව 2019 සිට 2021 වර්ෂය තුල ක්‍රියාත්මක කොට අවසන් කිරීමේ ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කොට තිබූ මෙම ව්‍යාපෘතිය ප්‍රවාහන රාජ්‍ය අමාත්‍යාංශය ආරම්භ කළ 2020 වර්ෂයේ සිට කටයුතු කිරීමට රාජ්‍ය අමාත්‍යාංශය වෙත | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වූ අතර, ඉන්දියානු ණය ආධාර යටතේ ශ්‍රී ලංගමයට බස්රථ මිලදී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදනයේ අවසාන අදියර වශයෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු නමුත් 2021.12.02 දින අමාත්‍ය මණ්ඩල සංදේශය ඉදිරිපත් කළ ද එය අනුමත කරන ලද්දේ | අයවැය ප්‍රතිපාදන නිසිපරිදි කාර්යක්ෂමව අදාල ව්‍යාපෘතිය සඳහා යෙදවිය යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| | පැවරී තිබුණි. කෙසේ වෙතත් 2021 වර්ෂය තුල මේ සඳහා රු.මි.850 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර වර්ෂය තුලදී අපේක්ෂිත භෞතික ප්‍රගතිය 55% ක් විය. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ප්‍රතිපාදිත මුදලින් කිසිදු වියදමක් දරා නොතිබුනා සේම අපේක්ෂිත භෞතික ප්‍රගතියද ලගාකර ගැනීමට නොහැකි වී තිබුණි. | 2022.01.11 දිනදීය. එබැවින් අදාල මුදල් වර්ෂයේ කටයුතු කිසිවක් සිදුකල නොහැකි වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇති නමුත් මේ වන විට එම ප්‍රසම්පාදනයට අදාළව සැපයුම්කරු සමඟ ගිවිසුම් අත්සන් කර ණයවර ලිපියද විවෘත කර ඇති බව දන්වමි. | |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුලදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත පුනරාවර්තන වියදම් සඳහා රු.මිලියන 11,823 ක් හා මුලධන වියදම් සඳහා රු.මිලියන 2,405 ක ප්‍රතිපාදන වෙන්කර තිබූ අතර ඉන් සමාලෝචිත වර්ෂය තුලදී පුනරාවර්තන වියදම් ලෙස රු.මිලියන 11,407 ක් හා මුලධන වියදම් ලෙස රු.මිලියන 1,321 ක් වැයකර තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය විසින් අදාල ප්‍රතිපාදන මුලධන හා පුනරාවර්තන වියදම් ලෙස වියදම් වර්ගීකරණයක් අනුව වියදම් පවත්වා නොගැනීම මත හා අමාත්‍යාංශය විසින් වැය විස්තරයක් වර්ෂාවසානයේ දී ලබා නොගැනීම හේතුවෙන් වියදම් පිළිබඳ තහවුරුවක් ලබා ගැනීමට නොහැකි විය. | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලබා දෙන ප්‍රතිපාදනවලින් දරණ වියදම් සඳහා මුලධන හා පුනරාවර්තන වශයෙන් වෙන්කර වාර්තා පවත්වා ගෙන යන ලෙසට උපදෙස් ලබා දී ඇති අතර ඉදිරියේදී එම වාර්තා ලබාගත හැකි බව කාරුණිකව දන්වමි. | වියදම් මුලධන හා පුනරාවර්තන ලෙස වර්ගීකරණය කර පවත්වාගත යුතුවීම. |
| (ඇ) | වැසිකිලි පද්ධතිය ඉදිකිරීම සඳහා බාහිර පාර්ශවයක් වෙත කොන්ත්‍රාත් ක්‍රමයට කටයුතු කිරීමෙන් තොරව සෘජු ශ්‍රම ක්‍රමය යටතේ ඉදිකිරීමට ගනු ලැබූ තීරණය හේතුවෙන් වර්තමානයේ පවතින අමුද්‍රව්‍ය වල මිල ගණන් ඉහලයාම හේතුවෙන් අපේක්ෂිත ඇස්තමේන්තු වටිනාකම වූ රු.4,991,395 ක් ඉක්මවා රු.6,021,248 ක වියදමක් 2021 දෙසැම්බර් 31 දින වන විට දරා තිබුණි. මෙය ඇස්තමේන්තුවෙන් සියයට 21 ක තරම් වැඩිවීමක් වී තිබුනි. | බාහිර ආර්ථික සාධක හේතුවෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ අමු ද්‍රව්‍ය වල මිල ගණන් ඉහලයාම හා විශේෂයෙන් ටයිල් හා සනීපාරක්ෂක ද්‍රව්‍ය වල මිල ගණන් ඉහල යාම හේතුවෙන් ඇස්තමේන්තු ප්‍රතිපාදන සියයට 35 ත් සියයට 40 ත් අතර ප්‍රමාණයකින් ඉක්මවා යා හැකිවීම. | රජයට උපරිම වාසියක් ඇතිවන ආකාරයට ඇස්තමේන්තු ප්‍රතිපාදන භාවිතා කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉහත ව්‍යාපෘති වියදම ඇස්තමේන්තුව ඉක්මවා ගොස් තිබුනද විගණනයේදී නිරීක්ෂණය වුයේ ව්‍යාපෘතියේ තවදුරටත් සියයට 30 ත් සියයට 40 ත් අතර වැඩ කොටසක් නිම කිරීමට තිබූ බවයි. ඒ සඳහා වැඩි පුහුණු ශ්‍රමය සහිත මිනිස් දින ගණනාවක් ගත විය හැකි බවද නිරීක්ෂණය විය. මේ හේතුවෙන් ඇස්තමේන්තු පිරිවැය වැඩි ප්‍රතිශතයකින් ඉහල යාමට හැකියාවක් ඇතිවිය හැකිබව විගණනයේදී නිරීක්ෂනය විය. | ව්‍යාපෘති අංශයේ නිලධාරීන් කොවිඩ් රෝගයට ගොදුරු වීම හා වෙළඳපලේ භාණ්ඩ වල හිඟතාවය හේතුවෙන් හා භෞතික විචලනයන් සඳහා අවශ්‍ය පුහුණු හා නුපුහුණු සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන ඉක්මවා යා හැකි අතර ඒ සඳහා කමිටුවක් පත්කර වැය ඇස්තමේන්තුවක් සංශෝධනය කිරීමට කටයුතු කර ඇත. | හැකි තරම් රජයට අවම බරක් වන සේ ඇස්තමේන්තු සැකසීමට හා ක්‍රියාත්මක කිරීමට පියවරගත යුතුවේ. |

## 3.2 වත්කම් කළමනාකරණය

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| **නිශ්කාර්ය වත්කම්** | | |
| 2021 වර්ෂයේදී රු.343,960 ක වියදමක් දරා අමාත්‍යාංශය විසින් මිලදී ගත් ලැප්ටොප් පරිගණකයන් 2022 වර්ෂයේ අප්‍රේල් අවසානය දක්වාම ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ රඳවා තිබූ බව නිරීක්ෂණය විය. | ලැප්ටොප් යන්ත්‍රය රාජ්‍ය අමාත්‍යතුමාගේ මාධ්‍ය ලේකම් වෙත ලබා දීම සඳහා මිලදී ගත්තද මාධ්‍ය ලේකම් වෙත භාරදීමට සුදානම් වන අවස්ථාවේ එහි දෝෂයක් පැන නැගුන බැවින් එය නිකුත් නොකර රඳවා ගන්නා ලදී. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනා ගෙන මිලදී ගැනීම සහ මිලදීගත් වත්කම් ඵලදායී ලෙස උපයෝජනය කලයුතු වීම. |

## 3.3 හානි පාඩු පරීක්ෂාව

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| අනතුරට ලක්වූ වාහන දෙකක රක්ෂණයෙන් ආවරණය නොවන රු.60,223 ක අළුත්වැඩියා වියදම පමණක් කපා නොහල වියදම ලෙස ගිණුමේ දැක්විය යුතු වුවද වාහන 5ක අනතුරු අළුත්වැඩියා වියදම වූ රු.593,350 ක මුදල කපා නොහල අලාභ ලෙස වැරදි ලෙස ගිණුමේ දක්වා තිබුණි. | වාහන අනතුරු සම්බන්ධයයන් සිදු වූ අලාභයන් සම්පූර්ණයෙන්ම එහි සඳහන් කර තිබූ අතර , ඉදිරියේදී එය නිවැරදි කිරීමට උපදෙස් ලබා දෙන ලදී. | නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන වල ගිණුම්ගත කලයුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පරීක්ෂා කිරීමේදී තනතුරු 9ක පුරප්පාඩු 48 ක් නිරීක්ෂණය විය. | අමාත්‍යාංශය සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයේ, කළමනාකරණ සහකාර සේවයේ හෝ සංවර්ධන නිලධාරීන් නොසිටි අතර, 2022 වර්ෂයේ සිට ස්ථිර කාර්ය මණ්ඩලයක් වශයෙන් සංවර්ධන නිලධාරින් පත් කර ඇත. | අවශ්‍යතා සැලකිල්ලට ගෙන කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කලයුතු වීම. |